




**'අසෙනිය කුසුම' තීරුව දිග හැරෙන්නේ අපේ හිත ගත් කවියක විඳුම් විඳවුම් කෙබඳුද යන්න සහෘද ඔබත් සමඟ බෙදා හදා ගන්නටය. මෙය තවත් එක කාව්‍ය විචාරයක් නොවන අතර තොරාගනු ලබන කවියක් හොඳද නරකදැයි නිගමන නොදී, මිණුම් දඬු හා විචාරක්ෂීන් ගලවා තබා කවිය තුළම ගිලී කිමිදී රස උල්පත් පාදා ගන්නයි මේ කුඩා වෑයම.**

## මොඩර්න් සිත්තරෙක්

**චීවරය දැරූව ද මුවින් බණ නො ම දෙසන**
**සාර්ලිස් පරපුරේ සිත්තරෙකි එහිමි නම**
**කලාභවනේ කලක් උගත් සිතුවම් දැනුම**
**පින්සලෙන් හැඩ දමා වර්ණයෙන් බණ දෙසන...**

**වන වැදුණ පන්සලක නෙළුම් මල් රූ නෙළන**
**පලංචිය තියා උස් පියසි සිතුවම් කරන**
**ගල් කටුව මිටිය ගෙන සෙල් පිළිම රූ තනන**
**හිටි පිළිම, ඉඳි පිළිම තම අතින් වඩමවන...**

**විටෙක කැන්වසය මත නාරි රූ දිය කෙළියි**
**සත් පියුම් පිපී ඇති ජීවිතය හිමි අඳියි**
**ඇදවැටෙන චීවරය යළි හදා ඇඟ ඔතා**
**හිමි අහිමි ජීවිතය නිම කරයි නිම කරයි...**

**උපාසක පිරිපතින් ඇවිළෙනා දොස් අසයි**
**මහ තෙරුන් මෙපවුකම් අත්හරින ලෙස දෙසයි**
**ආවාස ගේ පුරා ඇන්ද සිතුවම් පෙළයි**
**ප්‍රදර්ශනයක් පතා නිසි තැනක් හිමි සොයයි...**

**කාලයක් රජ කෙරුව වවුල් තටු දුගඳ යුතු**
**පන්සලේ පොත් ගුලේ අභිධර්ම පොත් අතර**
**සිතුවමක් වී හිඳින බොහෝ මහ තෙරුන'තර**
**හිමි තවත් සිතුවමක් නිම කරයි නිම කරයි...**

**නඳුන් යසිත දසනායක**
**'විල් නෙතක මල් මතක' කාව්‍ය සංග්‍රහය - 2016**

අනේකවිධ කවියන්ගේ විවිධාකාර කවි අතර විවිධ විචිත්‍ර චරිත අපට වරින් වර මුණගැසේ. නඳුන් විසින් ලියා ඇති මේ කවියත් එවැනි අපූරු චරිතයක් අරභයාය. කවියේ කියැවෙන ප්‍රධාන චරිතය එනම් පුද්ගලයා භූමිකා දෙකක් එකවිට නිරූපණය කරන්නෙකි. විටෙක චීවරධාරියකුගේ ද තවත් විටෙක සිත්තරකුගේ ද වශයෙන් එය ද්විත්ත්ව අනන්‍යතා ගොඩ නගයි. මේ චරිතයේ අපූර්වත්වය මතුවන්නේ හරිම උභතෝකෝටික ආකාරයකටය. එසේත් නැත්නම් මේ චරිතයට තමා යනු කවුදැයි හරියටම නිශ්චය කරගන්න බැරිවුණ අර්බුදකාරී බවක් හැඟෙන තරමටම ව්‍යාකූලය; සංකීර්ණය. ඒ වුණත්, පින්සලයෙන් චීවරයටත් චීවරයෙන් පින්සලයටත් මාරු වෙමින් ඒ ජීවිතය හා බැඳි ඇවතුම් පැවතුම් ගලායනයුරු අපූරුය.

පළමු කවියට හැරුණොත්, ඉන් කියැවෙන්නේ චීවරය දරා සිටියත් මුවින් බණ නොකියන පුරුද්දක් ඒ චරිතයට තිබෙන බවයි. එය බණ කියන්නේම නැතැයි කියනවාටත් වඩා, සාමාන්‍යය සසුන්ගත ස්වාමි නමකට සාපේක්ෂව අඩුවෙන් බණ දේශනාකරන බවක් හඟවනවා විය යුතුය. එනම්, එවැනි බණ කියන්නට ඇති අවස්ථාවන් මගහැරෙන බවක් හෝ මගහරින බවක් මේ චරිතය සතු විය යුතුය. එය එසේ වී ඇත්තේ ශාසනයේ උන්නද, එවන් හිමි කෙනෙකුගෙන් සැවොම අපේක්ෂා කරන දේට වඩා අමතර වැඩ මේ ස්වාමිනමට ඇති බැවිනි. නමුත් වඩා වැදගත් පැනය වන්නේ මුවින් බණ දෙසන්නේ නැති නම් කොහෙන් බණ දෙසනවාද යන්නයි. සාර්ලිස් පරපුරෙන් පැවත එන සිත්තරෙක් යැයි කීමෙන් චිත්‍ර කර්මය කෙරේ එහිමි තුළ වූ ආසක්ත බව හැඟවෙන අතර කලාභවනේ උගත් සිතුවම් දැනුමක් ගැන පැවසීමෙන් කාලයක් තිස්සේ චිත්‍ර ප්‍රදර්ශනාදිය බැලීමෙන් චිත්‍ර කලාව පිළිබඳ ලත් දැනුම හා අභාසයන් ගැන කියැවේ. ඒ සියල්ලේම අවසානය වන්නේ, පින්සලෙන් හැඩ දමා වර්ණ යොදා එහිමි අතින් නිමාවන චිත්‍රයයි. පන්සලේ දෛනික බණ භාවනා මග හැරුණද, ඒ ඒ වර්ණයන් ගෙන් මුදාහරින හැඟීම් මාත්‍ර ඔස්සේ අදහස් පිට කිරීම වර්ණයෙන් බණ දෙසනවා වැනි දෙයකියි අප කවියා පවසයි. එය අපූරු යෙදුමකි. එලෙස තම ජීවිතය විධාරණය කරගන්නත් ඒ තුළින් තමන් අදහන ධර්මතාවන් නිර්මාණය කොට මුදා හරින්නත් කලාව භාවිතාකරනායුරු දැක්වීම පින්සලෙන් බණ කීමකට සමාන කිරීම නැවුම්ය. ඒ බණ කීමේ වෙනත් මානයක් සේය. එවන් කලාවන් හි නිරත වීම හෝ කත්තුකම්‍යතා ඡන්ද මත එල්බගෙන චිත්ත සමාධිය හෝ සිතේ එකඟතාව ලැබීම මහණ කෙනෙකුට පූර්ණ වශයෙන් අකැපද යන්න මම නොදනිමි. නමුත් ඒ වෙනුවෙන් ඇදී බැඳී සිටීම තුළ තමා සසුන්ගත වූ කර්තව්‍යයේ පරම අපේක්ෂාවන් සිදුවන්නේද නොවන්නේද යන්න එහිමිම තමාගෙන්ම ප්‍රශ්න කරගත යුතු අතර, ඒ අප තව දුරටත් සොයා නොවෙහෙසිය යුතු වෙනමම පැනයකි. එය අපට නොවැදගත්ය.

මේ කාලාන්තරයක් කලභවනේ චිත්‍ර කලා ආදියත් සමඟම ඇලී ගැලී හිඳ ඒ තුළින් ලබා ගත නොහුණු යම් උත්තරීතර සනාතන දහමක් අත් පත් කරගැනීමට සසුන්ගත වූවද, තමා සාංසාරික පුරුද්දක් ලෙස රැගෙන ආ ඒ කලාවන්ට ලැදි බව අත්හැර ගනු බැරිවුණ තෙරණුවකුගේ සසුන්ගත ජීවිතයේ ගැටළු සහගත මූලාරම්භය ගැන කියැවෙන අපූරු කවියකියි මට හැඟේ.



එහිමි වසන්නේ වන වැදුණ පන්සලකය. ඒ භාවනාවම අරමුණු කරගෙන නික්ම ගිය ගමනක් විය යුතුය. නමුදු තවමත් ඔලොගුවේ රැගෙන ආ යම් යම් දේ ඉතුරුවී ඇත. ඒ සියල්ලම සැණෙන් ඉවතලා හිත එක අරමුණකට ගෙන තමා පැමිණි උත්තරීතර කර්තව්‍යය මුදුන්පත් කරගැනීමට නොහැකි සෙයකි. ඒ ඇරඹුම දුෂ්කරය. එහිමි ඒ පන්සලේ නෙළුම් මල් රූ නෙළන සේක; පලංචියට නැඟ ළං විය නොහැකි උස් පියසි මත සිතුවම් අඳින සේක; ගල් කටුව මිටිය ගෙන සෙල් පිළිම රූ තනා ඒ පිළිම තම දෝතින්ම වඩම්මන සේක. මේ නම් බණ දෙසන්නට ආ හිමි නමක් නොව, කලාවම භාවනාව කොට ගෙන හිත එක අරමුණක තබා ගෙන ධ්‍යානගත වන්නට මාන බලනා හිමි නමක් වැනිය. නමුත් පන්සලේ මහනායක හිමි හෝ දායක උපාසක කැළ අපේක්ෂා කරන්නේ එවැන්නෙකුගෙන් එවැන්නක් නොවේ. ඉතින් මෙය අර්බුදයක් වන්නේ ගම්මුන්ට, විහාරවාසී අනිත් සංඝයා වහන්සේලාට පමණක්ම නොව, තමා සමගම කේවල අනන්‍යතාවක් මතුකර ගැනීමට අපොහොසත් වෙමින් තල දෙකක මාරු වෙන් මාරුවට පය තබමින් ජීවිතය සමබර කරගන්න උත්සාහ ගමින් හුදකලා සටනක නියුතු එහිමි තුළත්ය. එය විශාල අර්බුදයක් වන්නේ ඒ අර්ථයෙනි.

කැන්වසය මත විවිධ වර්ණ තවරන එහිමි අතින් ඉබේටම, නොදැනුවත්වම ළවැලි මතුයේ හිඳින නා මෙනෙවියන් බඳු දිය කෙලින නාරි රූ මැවෙයි; උන් වටා සත් පියුම් පිපී ජීවිතාශා දැල්වෙයි; අනුරාගී ස්ත්‍රී රූපකායන් මතින් අතරමග නැවතුණු ජීවිතයේ ඉතිරි අඩ නිමැවෙයි. තම මනසේ නළියන ඒ ඒ ආශාවන්වලට පන ලැබී විවිධ වර්ණ ගෙන කැන්වසය මත උපත ලබද්දී අනෙක් පසින් චීවරයේ රැළි බුරුල් වී ඇද වැටෙන්නට මාන බලන්නේ, අවනත නොවුණු සිතිවිලි දාමයන් හි ස්මරණමය ගනුදෙනුව තුළ නොහික්මුණු ඉඳුරන් තනා දීමෙනි. වහා කලබල වන එහිමි නැවතත් රැල් බුරුල් වූ චීවරය හදා ගන්නේ තමා අතින් මහා බරපතල වැරැද්දක් වූ සෙයකිනි. නමුදු මොනවා කරන්නද? මුලින් කියූ පරිදිම වන වැදුණ පන්සලක හිටියද ඔලොගුවේ තවමත් රැගෙන ආ මතක බර ශේෂ වී ඇත. එදා කලාභවනේ උන්නු කාලයේ ඇස් මට්ටමින් ආශ්‍රය කල නාරි දේහයන් අද දවසේ කැන්වසය මත පුනරුත්පත්තිය ලබනවා විය යුතුය. ඒවා ඕපපාතික නිමැවුම් නොවේ. ඒවා ඇතුළත පන පිහිටවූ කතාන්තර ඇත. මේ චිත්‍රය නිමකිරීම තුළ එහිමි කරන්නේ තමාට අහිමි වූ 'ඒ ජීවිතය' කාටවත් නොපෙනෙන ආකාරයට වක්‍රාකාරයෙන් හිමි කර ගැනීමක් නොවේද? නමුත් ගැටළුව වන්නේ එසේ සිතූවද, එය අනිත් අයටත් පෙනී යාමමය. ඒ අනුව 'හිමි අහිමි ජීවිතය' යනුවෙන් ලියා ඇති කොටස උභයාර්ථ නංවන්නේ විටෙක ඒ 'හිමි' නමට සම්පූර්ණයෙන්ම 'අහිමි වූ ජීවිතයක්' බවත්, තවත් විටෙක 'හිමිවන්නට ඔන්න මෙන්න තිබුණු', බලාපොරොත්තු බිඳ දා කළකිරීම් ඇතිකොට අන් සරණක් සොයන්නට, වනගත වන්නට යොමු කළ බලවේගයකුත් ලෙසය.

මෙහිමි අතින් නිමවන ඉඳුරන් හිරිවට්ටන මේ නාරි රූ දකින කල මුළු මහත් ලෝකයම කම්පා වූ සෙයකි. කාලාවට ලැදි එහිමි අතින් ආනන්තරීය පාප කර්මයක් සිදුවුණා සේ දහක් පිරිපත අප හිමි ඇඟට කඩා පනී. එහෙන් උපාසක කැළගේ දොස් පරොස්වලටත් අනෙක් පසින් තොරතෝංචියක් නැතුව මේ මහා පාප කර්මයන් ගෙන් වහා ඈත් වන ලෙස උපදෙස් අනුශාසනා දෙන ත්‍රිපිටකාදියෙහි අන්තර්ගත මුද්‍රිත දැනුමෙන් සන්නද්ධ මහ තෙරුනුත්ය. ඒ සියල්ල අතරේ අප හිමි නමගේ පැත්තට ඉන්න එකම පිරිස වන්නේ විහාර ගේ බිත්ති හා පියැසි මත තැනින් තැන අරක්ගෙන සිටින එහිමි අතින්ම ජන්ම ලද්දා වූ ද, කිසුදු කලබලයකින් තොරව වැඩවසන්නා වූ ද මේ රූප කායන්ය. මේ අතොරක් නැති බැණුම් හා අවලාදයන් මැද අප හිමි නමගේ මනස යළිත් දුවන්නේ කලාභවනටමය; ඒ ප්‍රදර්ශන භූමියටමය. මෙවන් පසුබිමක මහත් වෙහෙසක් ගෙන ඇන්දා වූ මේ කලා කෘතීන්ට මේ නම් අකැප වූ භූමියක්ම බව එහිමිට වැටහේ. එහිමිට දැන් දැන් වැටහෙන්නේ මේ චිත්‍රවලට හිමි තැන මෙතන නොව එතැන බවයි. ඒ කලාවටම කැපවූ කලාභවන බවයි. දැන්නම් මේ චිත්‍ර ටික නුසුදුසු තැනක ප්‍රතිසන්දියක් ලැබගත් ගන්ධබ්බ ආත්ම ටිකක් බඳුය. අප හිමි මහා කණසල්ලකින් පසුවේ. කලාව හා ශාසනය අතර දෝලනය වෙමින් අසීරු සමබරතාවක ජීවිතය මෙල්ල කර ගැනීමට එහිමි වෙහෙසේ. නමුදු කිසිදු ගාණක් නැතිව එහිමි අතින් ඉපැදුණාවූ ඒ ඒ චිත්‍රයෝ ඒ ඒ තැනට වී නොසෙල්වුණු ධ්‍යානයකට සමවැදී සිටිනායුරකි. ඊට ප්‍රතිමුඛව අප හිමියෝ සැලි සැලී බිඳි බිඳී තමන් සමගම අනවරත අරගලයකය.

කාලයක් වවුල් දුගඳ පිරී තිබුණු විහාර ගේ ආදිය නැවුම් සායම් සුවඳ වැදී පන ලබා ආවේ අපගේ කලාකාමී තෙරුනුවන් නිසාවෙනි. එනමුදු කාලයක් තිස්සේ කාරමක් සේ බැඳී ඇති මේ වවුල් ගඳට අප කොච්චර හුරුවී ඇත්ද යත්, අපට ඉන් මිදෙන්නට වුමනාවක් වත්, එහෙම හිතන්නට වත් ඕනෑ කමක් නැත. මේ කවියේ කියන වවුල් ගඳ යනු අපට තවමත් මිදෙන්න බැරිවුණු අපේම ජීවිතවල අඳුර නොවේද? පන්සලේ පොත්ගුල් අතර වැඩ වසන මහා අභිධර්ම පිටකයන් තුළ, ජාතක කතා තුළ ගල් ගැසී හිඳින, බොහෝමයක් තෙරුන් අතර අපිත් අපේ ජීවිතත් හිර කොට තබා සදාකාලික වවුල් ගඳකම හිරවී සිටින්නෙමු. එවන් උපාසක කැළකට නැවුම් සායම් සුවඳ වැඩක් නැත. විවෘතව හිතන්නට අවැසි නැත. මෙන්න මෙවැනි ප්‍රශ්න අප හිමි නම ඇතුළේ ද හොල්මන් කරයි. නමුත් එහිමි නම ඉන් නොසැලී හෙට දවස වෙනුවෙන් තවත් එවැනිම සිතුවමක් අඳියි.

ඉතා විරල චරිත ලක්ෂණයක් ඔස්සේ විවිධ අනන්‍යතා එකට ගැට ගසමින් ගැටුම් නිර්මාණය කරමින් නඳුන් මේ ප්‍රශ්න කරන්නේ කාලයක් තිස්සේ අපේ ඔලු ඇතුළේ ලාටුවක් සේ හිරවී රජ කරන පැනයක් ගැන නොවේද? කලාව අවැසිම වන්නේ එවැනි ගැටුම් අවම කොට ගෙන අලුත් විදියකට ලෝකය දකින්නත් ඒ ඔස්සේ නව දැනුමක් සම්ප්‍රාදනය කරන්නත් නොවේද? ආගම යනු සිරගත වී අපේම නිදහස හා නිවහල් බව අවුරාගන්නට තනා දුන් සිර මැදිරියක් නොවන බව වටහා ගන්නට අපට පුළුවන් නම් එය කොතරම් අගේද? එවැනි කරුණු කාරණා අබිමුව වවුල් ගඳටම ආසක්ත වී එවැනි නව චින්තන ධාරාවන්ට මං අහුරමින්, පොත් පිටු අතරම සිර වෙමින්, ජීවිතයෙන් දුරස් නොවිය යුතු නමුදු අවභාවිතය තුළම වඩාත් දුරස්ථ සේ දැනෙන දැනුම් පද්ධතිවල හිමිකරුවන් වීම අවාසනාවකි. එවන් තත්ත්වයක ජීවයෙන් තොර ජීවිත වගේ කලුවර ආවාස කුටිවලටම වැදී, හෙට දවස වෙනුවෙන් නැවුම් ඉර එළියක් සුවඳක් ගැන සිහිනයක් වත් නොදැකම නින්දට යොමුවුණ අපේ විඥානයට සියුම් ආලෝක ධාරාවක් සපයන්නට මේ කවිය සමත් වී ඇත; අලුත් සායමක් තවරන්නට උත්සාහ ගෙන ඇත.

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com